// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2164/24 - 2020 පෙබරවාරි මස 26 වැනි බදාදා - 2020.02.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොට ගෙන මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ මුහන්දිරම් රාලලාගේ ධම්මිකා උදයංගනී පුෂ්පකුමාරී අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලෙකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා අබයරත්න හේරත් මුදියන්සේලාගේ ශ්‍රියානි සුමිත්‍රා කුමාරිහාමි අබයරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී, සජිත් වසන්ත වෙල්ගම වන මම, පළාත් පාලන ආයතන ඡන්ද වීමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අබයරත්න හේරත් මුදියන්සේලාගේ ශ්‍රියානි සුමිත්‍රා කුමාරිහාමි අබයරත්න, මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

සජිත් වසන්ත වෙල්ගම,
තේරීම්භාර නිලධාරී,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

2020 පෙබරවාරි මස 26 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කෑගල්ල.

03 - 442

1A - G 32100— 27 (2020/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*